සැ. යු.- 2011.06.03 දින පළවූ අංක 1709 දරන ගැසට් පත්‍රයේ I-II(අ) සහ IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,710 - 2011 ජූනි මස 10 වැනි සිකුරාදා - 2011.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)



| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 276 |



සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූනි මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූනි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

ලක්ෂමන් ගුණවර්ධන,<br>රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,<br>රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,<br>කොළඹ 08.

# විවිධ දැන්වීම්

**පෙත්සම පිළිබඳ දැන්වීම**

සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

ගල්කිස්ස, ගාලු පාර, අංක 322 දරන ස්ථානයේ පිහිටි වෙස්පැක් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

ගණන් බේරා වසා දැමීමේ
ඉල්ලීම අංක එච්සී (සිවිල්) 16/2011(සීඕ)

සහ
2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලීමක් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

කොළඹ 2, වොක්ෂෝල් වීදිය, අංක 305 හි එයිට්කන් ස්පෙන්ස් ෂිපිං ලිමිටඩ්.

පෙත්සම්කරු..........

සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 2, වොක්ෂෝල් වීදිය, අංක 305 හි එයිට්කන් ස්පෙන්ස් ෂිපිං ලිමිටඩ් විසින් 2011 මාර්තු මස 9 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2011 ක්වු ජූලි මස 6 වැනි දින අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියමකර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණයහිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥ මහතෙකු හෝ ලේඛනගත නීතිඥයෙකු මඟින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තවද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියමකර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

මුරුගේසු සහ නීලකන්ඩන්
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥයින්
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල, (5 වන තලය)
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

*සටහන :*

එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු එසේ කිරීමට ඇති ඔහුගේ අදහස ඉහත නම සඳහන් නීතිඥ ව්‍යාපාරය වන මුරුගේසු සහ නීලකන්ඩන් මහතුන් වෙත ලිඛිතව හෝ තැපැල් මඟින් භාර දිය යුතුය. තැපැල් මඟින් එවීම අවශ්‍යවන පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම් එහි නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එය පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරුණු ලැබීම හා එය 2011 ජූලි මස 5 වැනි දින පස්වරුවේ වේලාව හයට පෙර ඉහත නම සඳහන් අයවළුන්ට ලැබෙනසේ කල් වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ කිරීම අවශ්‍ය වේ.

මුරුගේසු සහ නීලකන්ඩන්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥයින්.

06-189

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.